සිරකරු සුභසාධක අරමුදල - 2020
------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1. තත්ත්වාගණනය කළ මතය
-------------------------------

සිරකරු සුභසාධක අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
--------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.**

**1.4.** **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

**සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,**

- **ප්‍රකාශ කරනලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරනලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.**

- **අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුනද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.**

- **භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.**

- **සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.**

- **මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.**

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 1 හි 02 ඡේදය අනුව සාමාන්‍ය අවශ්‍යතාවයන් සඳහා සියලුම මූල්‍ය ප්‍රකාශන උපචිත ගිණුම්කරණ පදනම මත පිළියෙල කළ යුතුය. නමුත් අරමුදලේ ආදායම් ප්‍රභවයන් දෙකක් මුදල් පදනමට ගිණුම් ගත කර තිබුණි. | වැලිකඩ හා වටරැක බන්ධනාගාරයේ යම් දත්ත ඇතුලත් කිරීමේ දෝෂයක් නිසා උපචිත ආදායම් ලෙස හා පසුගිය වසරේ ආදායම් ලෙස විස්තර ඇතුලත් කර ඇත. සිගාස් සටහන් හා විස්තර නොගැලපීම නිසා නැවත කල විමසීමේ දී අදාල නිලධාරීන් විසින් එම වාර්තා නිවැරදි කිරීමට කටයුතු කල අතර අවසන් වාර්තා විගණනය වෙත ඉදිරිපත් කරන අවස්ථාව වන විට එම නිවැරදි කිරීම් සහිත වාර්තාවන් ලැබී නොතිබුණි. මේ සමග අදාල වාර්තා ඉදිරිපත් කර ඇත | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |

**1.5.2.** ගිණුම්කරණ ප්‍රතිපත්ති

| අදාළ ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බන්ධනාගාර ආයතන වෙත ලැබෙන පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ගිණුම්ගත කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.2,195,395 ක පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ලැබීම් හා තොග මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සිරකරුවන්ගේ පරිහරණය සඳහා පරිභෝජ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කරන අතර එම භාණ්ඩ සිරකරුවන්ගේ පරිහරණය සඳහා ලබා දීමට කටයුතු කරයි. එහිදී එම භාණ්ඩ පරිභෝජනයෙන් අවසන් වීම හේතුවෙන් ඒවා තොග ලෙස අවසන් ගිණුමට ගැලපීම් සිදු නොකරයි. එසේම වත්කම් ගිණුම්ගත කිරීම ක්‍රමවත් කිරීම සඳහා වත්කම් ප්‍රවර්ථන වර්ෂයේ සිට විසර්ජන ගිණුම මගින් වාර්තා කිරීමට කටයුතු කරමින් සිටියි. | පාරිභෝජ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග ගිණුම්ගත කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වා දිය යුතුය. |

**1.5.3.** නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ජාතික රාජ්‍ය සභාවේ 1979 අංක 54 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධක අරමුදලේ සංශෝධන පනත 4 "අ" වගන්තිය | පොදු තැන්පත් ගිණුමේ හා සේප්පුවල තිබුණු වර්ෂයකට නොඅඩු කාලයක් තුළ හිමිකම් නොපාන ලද වේතන හා පෞද්ගලික මුදල් රු.4,554,557 ක් අරමුදලට බැර කර නොතිබුණි. | අදාළ ආයතන වලින් හිමිකම් නොපෑ මුදල් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ වාර්තාවක් කැඳවා ඒවා සිරකරු සුබසාධක අරමුදලට බැර කිරීමට බන්ධනාගාර අධිකාරිවරුන්ට අවශ්‍ය උපදෙස් ලබා දීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයෙන් ඇතුළත් කළ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ i.මුදල් රෙගුලාසි 876 2 (ආ) ඡේදය | අරමුදලක් තවදුරටත් පවත්වාගෙන යාම අවශ්‍ය නොවේයැයි හෝ අපේක්ෂිත අරමුණු රාජ්‍ය අයවැය යටතේ ඉටුකරගත හැකි බව පෙනී යන්නේනම් එම අරමුදල්වල කටයුතු අවසන් කිරීමට වහාම පියවර | අරමුදලේ ශේෂය සිරකරුවන්ගේ සුභසාධන කටයුතු පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් මට්ටමක නොපවතින බැවින් සහ අරමුදල වෙනුවෙන් ආදායම් ලැබෙන මාර්ග අවිනිශ්චිත වීම, වෙනත් කිසිදු මූල්‍යමය දායකත්වයක් නොමැතිවීම යන හේතු මත විගණනය | ආදායම් මාර්ග වැඩි කර ගැනීම හෝ අරමුදල තවදුරටත් පවත්වාගෙනයාම අවශ්‍ය නොවේ නම් චක්‍රලේඛය උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගත යුතුය. නමුත් මෙම අරමුදලේ ශේෂය සුභසාධක කටයුතු සඳහා ප්‍රමාණවත් නොවන නිසා දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ මුදල් ඒ සඳහා වැයකලද විගණිත දිනය වන විටද චක්‍රලේඛ උපදෙස්වලට අනුගතව කටයුතු කර නොතිබුණි. | විසින් දක්වා ඇති අංක **01/2020** හා **2020** අගොස්තු **28** දිනැති මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛයෙහි පළමු කොටසෙහි **15.1** ඡේදයේ **2**(අ) ප්‍රකාරව තවදුරටත් පවත්වාගෙන යාම අවශ්‍ය නොවේයැයි පෙනී යන හෝ ඒ අරමුදල මඟින් අපේක්ෂිත අරමුණු රජයේ විසර්ජන පනතේ අනුමත කරන රාජ්‍ය අයවැය යටතේ ඉටුකරගත හැකි බව පෙනී යන්නේ නම් එම අරමුදල වල කටයුතු අවසන් කිරීමට වහාම පියවර ගත යුතුය යන කරුණ කෙරෙහි අවදානය යොමු කර අරමුදලේ ඉදිරි කටයුතු සම්බන්ධව ක්‍රියා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | |
| **ii.**මුදල් රෙගුලාසි **877 2** (අ) ඡේදය | අරමුදල සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වා නොමැති අතර සුභසාධක අරමුදලේ ගණුදෙනු දෙපාර්තමේන්තුවේ නිල බැංකු ගිණුම යටතේ ඉටුකරගෙන තිබුණි. | විගණන නිරීක්ෂණ මඟින් මුදල් රෙගුලාසි **877** හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ **01/2020** ප්‍රකාරව අරමුදලක් සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වාගත යුතු බව අවධාරණය කර ඇති හෙයින් අදාල ගණුදෙනු සඳහා නව බැංකු ගිණුමක් විවෘත කිරීමට ඉදිරි කටයුතු ඉටු කිරීම සඳහා සටහන් කර ගත් බව. | මුදල් රෙගුලාසි **877** ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.** මූල්‍ය සමාලෝචනය
---------------------

**2.1.** මූල්‍ය ප්‍රතිඵලය
---------------

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශනවල අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.**763,088** ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.**1,359,184** ක ඌනතාවයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.**596,096** ක වර්ධනයක් සිදුව තිබුණි. සමාලෝචිත වර්ෂයේ අරමුදල මඟින් ක්ෂය හැරුණුවිට කිසිදු වියදමක් දරා නොතිබීම මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අරමුදලේ ප්‍රගතිය මැනීම සඳහා කාර්යසාධන දර්ශක හඳුන්වා දී නොතිබූ අතර බන්ධනාගාරවල පැවැත්විය යුතු වැඩසටහන්වල ස්වභාවය, සහභාගි කළ යුතු සිර/ සැකකරුවන් සංඛ්‍යාව, දැරීමට සිදුවන පිරිවැය ඇතුළත්ව පූර්ව සැලසුම් සකස්කර එම සැලැස්ම්වලට අනුව ප්‍රගතිය වාර්තා නොකිරීම නිසා අරමුදලේ අරමුණු ඉටුකිරීමේ මූල්‍ය හා භෞතික කාර්යසාධනය ඇගයීමට නොහැකි විය. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. අරමුදලේ ආදායම් මාර්ග අවිනිශ්චිත තත්ත්වයක පැවතීම, රජයේ දායකත්වයක් නොමැති වීම වැනි කරුණු මත අරමුදලේ ශේෂය ප්‍රමාණවත් නොවීම නිසා සමාලෝචිත වර්ෂයේ වැය දැරීමට ප්‍රමාණවත් අරමුදල් නොතිබීමෙන් ඇති වූ තත්ත්වය මත සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුවක් සකස් නොකල අතර මෙම අරමුදල ශක්තිමත් කර ඉදිරියේදී තවදුරටත් අරමුදලේ ප්‍රගතිය මැනීම සඳහා කාර්යසාධන දර්ශක හඳුන්වා දීමට කටයුතු කරන ලෙස බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) වෙත උපදෙස් ලබා දීමට සටහන් කරගත් බව. | අරමුදලේ වැඩසටහන් සඳහා පූර්ව සැලැස්මක් ද එම සැලැස්මට අනුව කාර්යසාධනය ඇගයීමට කාර්යසාධන දර්ශක හඳුන්වා දී ඇගයීම් සිදු කොට ප්‍රගතිය වාර්තා කළ යුතුය |
| (ආ) සිරකරුවන් නිදහස්කල පසු ඔවුන්ගේ පුනරුත්ථාපනයට උපකාරවන පශ්චාත්භාර සේවා සඳහා අරමුදලෙන් කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොතිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ.අරමුදලේ ආදායම් මාර්ග අවිනිශ්චිත තත්ත්වයක පැවතීම, රජයේ දායකත්වයක් නොමැති වීම වැනි කරුණු මත අරමුදලේ ශේෂය ප්‍රමාණවත් නොවීම නිසා සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුවක් සකස් නොකරන ලද නමුත් අරමුදලේ පරමාර්ථයන් යම්තාක් දුරකට හෝ ඉටු කර ගැනීම සඳහා බාහිර ආයතන හා ස්වේච්ඡා සංවිධාන වල අනුග්‍රහයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. | නිදහස ලබන සිරකරුවන්ගේ පුනරුත්ථාපනයට උපකාරවන පශ්චාත්භාර සේවා සඳහා සුදුසු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක විය යුතුය. |

### 3.2. මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සිරකරු සුභසාධක අරමුදලක් පිහිටුවීම, සිරකරුවන්ගේ පොදු ශුභ සිද්ධිය සඳහා එයින් වියදම් දැරීම හා ඊට සම්බන්ධ අනුෂාංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන බන්ධනාගාර | 2020 වර්ෂයේ සිරකරු සුබසාධක අරමුදලේ සුබසාධන කටයුතු සඳහා වන වියදම් දැරීම සඳහා අරමුදලේ පැවති ශේෂය ප්‍රමාණවත් නොවන අතර භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහයක්ද නොමැති බැවින් 2020 වර්ෂය සඳහා | පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධක අරමුදල් පනත පිහිටුවා තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ සිරකරුවන්ගේ සුභසාධක වැඩසටහන් සඳහා අරමුදලින් කිසිදු වියදමක් දරා නොතිබුණි. | ඇස්තමේන්තුවක් සකස් කිරීමක්ද සිදු නොකරන ලදී. 2020 වර්ෂයේ අරමුදල මගින් කිසිදු වියදමක් දරා නොතිබූ නමුත් සිරකරුවන්ගේ සුබසාධන කටයුතු සඳහා බාහිර පාර්ශවයන්ගෙන් ලැබෙන දායකත්වයන් තුලින් එම කටයුතු බොහෝ දුරට ඉටුකර ගෙන තිබුණි. | |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1. වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභගත කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති හා අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877 (2)(ඈ) ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත අරමුදල පිළිබඳ සහතික කළ මූල්‍ය ප්‍රකාශන ද සමඟ කාර්යසාධන වාර්තාවක් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපත් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | 2020/01 අනුව 2021 වසරට අදාල කාර්යසාධන වාර්තා නිවැරදිව සකස් කර මූල්‍ය ප්‍රකාශන පිටපත් සමග රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට හා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට සටහන් තබා ගත් බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

**4.2. අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 දෙසැම්බර් 26 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය අනුව සමාලෝචිත වර්ෂයට අදාළ අරමුදලේ වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කර අදාළ අනුමැතීන් සහිතව සැප්තැම්බර් 30 දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අරමුදලේ ආදායම් මාර්ග අවිනිශ්චිත තත්ත්වයක පැවතීම, රජයේ දායකත්වයක් නොමැති වීම වැනි කරුණු මත අරමුදලේ ශේෂය ප්‍රමාණවත් නොවීම නිසා සමාලෝචිත වර්ෂයේ වැය දැරීමට ප්‍රමාණවත් අරමුදල් නොතිබීමෙන් ඇති වූ තත්ත්වය මත සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුවක් සකස් කිරීම සිදු නොකරන ලද බව දැනුම් දෙමි. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |